# පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශයේ අන්තර්ගත කථාන්දර මගින් විශද වන ගැටුම්වල ස්වභාවය

කරඳගොල්ලේ සෝභිත හිමි

**Abstract**

Pañcatantra and Hitopadeśa of Sanskrit Didactic Literature provide an understanding of jurisprudence related to governance. Especially according to the Pañcatantra and Hitopadeśa, it is possible to identify the factors affecting the occurrence of conflicts and problems, such as the lack of a political structure that can carry meaningful control and the absence of acceptable borders, ethnic factors, political factors, economic and social factors, and cultural factors. Based on these factors, it has described the sources that cause conflicts, crises, and destruction between individuals and society. Among those reasons described in the Pañcatantra and Hitopadeśa, we can find ignorance, lust, wrong behavior, misunderstanding, inappropriate speech, and intolerance of others.

Due to these reasons, it can be recognized that the changes that occur in individuals make them physically and mentally tired, regretful, and anxious, which in turn affects the creation of various conflicts and crises in the social structure. Therefore, the aim of this research is to identify the nature of such conflicts.

**Key-word: C**onflicts, Crises, Pañcatantra, Hitopadeśa

ප්‍රමුඛ පදඃ ගැටුම්, අපරාධ, පඤ්චතන්ත්‍රය, හිතෝපදේශය

**හැඳින්වීම**

සංස්කෘත උපදේශ සාහිත්‍යාගත පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය මගින් රාජ්‍ය පාලනයට අදාළ නීති ශාස්ත්‍රය පිළිබඳ අවබෝධය ලබා දෙයි. විශේෂයෙන් පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශයට අනුව ගැටුම් හා ප්‍රශ්න ඇතිවීම සඳහා බලපාන සාධක වශයෙන් අර්ථාන්විත පාලනයක් ගෙන යා හැකි දේශපාලන ව්‍යුහයක් නොමැති වීම හා පිළිගත හැකි දේශසීමාවන් නොතිබීම, ජනවාර්ගික සාධක, දේශපාලන සාධක, ආර්ථික හා සාමාජීය සාධක හා සංස්කෘතික සාධක යන කාරණාවන් හඳුනාගැනීමට හැකි වේ. එම සාධක මුල්කොට පුද්ගල සන්තානගතව හා සමාජයේ ජීවත්වන්නවුන් අතර ගැටුම් හා අර්බුද ප්‍රභවයෙහිලා මෙන් ම විනාශය පිණිස බලපාන සර්වකාලීන වූ හේතු රාශියක් විස්තර කරයි. පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ විස්තර කරන එම හේතු අතර නූගත්කම, තෘෂ්ණාව, වැරදි හැසිරීම, වැරදි වැටහීම, නුසුදුසු භාෂණය, අන්‍ය මත නො ඉවසීම ආදි හේතු දක්නට ලැබේ.

එම හේතුන් කරණ කොටගෙන පුද්ගල සන්තානගතව ඇති වන විපර්යාසයෙන් ඔවුන් කායිකව හා මානසිකව වෙහෙසට, පසුතැවීමට හා කනස්සල්ලට පත්වන බවත් එය ම සමාජ දේහය තුළ විවිධ ගැටුම් හා අර්බුද නිර්මාණය වීමට බලපාන බව හඳුනාගත හැකි වේ. මෙම පර්යේෂණය මගින් උත්සුක වනුයේ එලෙස ඇතිවන ගැටුම්වල ස්වභාවය පිළිබඳ හඳුනාගැනීමට ය.

**පර්යේෂණ ගැටලුව**

පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය තුළ අන්තර්ගත කථා හා සංසිද්ධින් මගින් විවිධ ගැටුම් හඳුනාගත හැකි වේ ද ?

**පර්යේෂණ අරමුණු**

- පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයෙහි කථා මගින් විශද වන විවිධ ගැටුම් හා ඒවායෙහි ස්වභාවය හඳුනාගැනීම
- එම ගැටුම් ඇතිවී ඇති සමාජ කණ්ඩායම්හි ස්වභාවය හඳුනාගැනීම

**පර්යේෂණයේ වැදගත්කම**

සංස්කෘත උපදේශ සාහිත්‍යාගත පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය පිළිබඳ සාහිත්‍යාත්මක වශයෙන් කරන ලද අධ්‍යයනයන් බොහෝමයක් දක්නට ඇත. එහිදි වැඩි වශයෙන් අවධානය යොමු කොට ඇත්තේ එම ග්‍රන්ථයන්හි අන්තර්ගතය හා විවිධ සංස්කරණයන් පිළිබඳ ව ය. විශේෂයෙන් රාජ්‍ය පාලනයට අදාළ නීති ශාස්ත්‍රය පිළිබඳ අවබෝධය ලබාදෙන එම ග්‍රන්ථයන්හි උපයුක්ත කථාන්දර හා සිද්ධීන් මගින් විස්තර කරන ගැටුම් හා ඒවායෙහි ස්වාභාවය පිළිබඳ කරන ලද අධ්‍යයන නොමැති තරම් ය. සමාජයේ ඇතිවන්නා වූ විවිධ ගැටුම් හා ඒවයෙහි ඇති වෙනස් ස්වරූපයන් පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය තුළ විස්තර කෙරේ. ඒ අනුව විවිධ ගැටුම් හා ඒවායෙහි ස්වරූපය පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත තොරතුරු අධ්‍යයනය කරනු ලබන විද්‍යාර්ථීන්ට මෙම විමර්ශනය මහත් පිටුබලයක් වේ.

**පර්යේෂණ සීමා**

මෙම පර්යේෂණයේ දී ගැටුම් හා අර්බුද ඇතිවීම සඳහා දැඩි තෘෂ්ණාව බලපාන ආකාරය පිළිබඳ නිර්ණය කිරීමෙහි ලා විෂ්ණුශර්මන් පඬිවරයාගේ පඤ්චතන්ත්‍රය හා නාරායණ ශර්මන් පඬිවරයාගේ හිතෝපදේශය යන ග්‍රන්ථ ද්වය පරිශීලනය කිරීමට අපේක්ෂා කරන අතර එම පුරාතන කෘතීන්හි අන්තර්ගත කථාන්දර හා සිද්ධීන් විමර්ශනයට භාජනය කෙරේ. එහි ලා උක්ත කෘති සඳහා M.R.Kale මහතා විසින් සංස්කරණය කරන ලද මූලපාඨ ඇතුළත් ග්‍රන්ථ භාවිත කෙරේ.

**සාහිත්‍ය විමර්ශන**

පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනයන් පිළිබඳ විමසා බැලීමේදී ත්‍ර්බනකසබ ෑාටැරඑදබ මහතා විසින් රචනා කරන ලද 'The Panchatantra Reconstructed Vol. II' (1924) කෘතියෙහි පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ අන්තර්ගතය පිළිබඳ වත්, ඒවායෙහි විවිධ සංස්කරණයන් පිළිබඳ ව දක්නට ලැබෙන විවිධ මතවාද පිළිබඳවත් ඉතා දීර්ඝ වශයෙන් විස්තර කර දක්වයි. නමුත් එම කෘතීන්හි අන්තර්ගත ගැටුම් හා ඒවායෙහි ස්වරූපය පිළිබඳ කරනු ලබන විස්තර කථනයන් දක්නට නොමැත.

A.B Keith මහතා විසින් රචනා කරන ලද 'A History of Sankrit Literature' (1928) කෘතියෙහි පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයෙහි කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ අවධානය යොමු කරමින් තොරතුරු ඉදිරිපත් කරන අතර මෙම පර්යේෂණය සඳහා ප්‍රස්තුතාගත මාතෘකාව පිළිබඳ කරුණු ගෙන හැර දැක්වීමක් සිදු නො වේ.

A.A. Macdonal මහතා සිය 'A History of Sanskrit Literature'(1899) නම් කෘතියෙහි ද ජී. එස්. බී. සේනානායක මහතා සිය 'සංස්කෘත සාහිත්‍යය' (1960) නම් කෘතියෙහි ද තත් කෘතීන්හි කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන අතර තත් කෘතීන්හි විස්තරන වන කථා හා සිද්ධීන් මගින් නිරූපණය වන ගැටුම් හා ඒවායෙහි ස්වභාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමක් නො කරයි.

මෙනයින් සලකා බලන කල පඤ්චතන්ත්‍රයෙහි හා හිතෝපදේශයෙහි අන්තර්ගත කථාන්දර හා සිද්ධීන් මගින් නිරූපිත ගැටුම් හා අර්බුද ඇතිවීමට බලපාන හේතු පිළිබඳ සිදුකරනු ලබන අධ්‍යයනයක් සිදුව නොමැති බව පැහැදිලි කළ හැකි ය. එනිසා ම පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය තුළ අන්තර්ගත කථා හා සිද්ධීන් මගින් විශද වන ගැටුම් හා ඒවායෙහි ස්වරූපය පිළිබඳව ද ප්‍රාමාණික අධ්‍යයනයක් සිදුව නොමැත.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තේමා විශ්ලේෂණ හා සංධාර පර්යේෂණ ක්‍රමය මෙහි දී උපයුක්ත කරගනු ලැබේ. සංස්කෘත උපදේශ සාහිත්‍යයේ එන විෂ්ණුශර්මන්ගේ පඤ්චතන්ත්‍රය හා නාරායණශර්මන්ගේ හිතෝපදේශය යන කෘතීන් සඳහා ලියැවී ඇති අටුවා, පරිවර්තන හා වෙනත් විස්තරකථනයන් පරිශීලනය කෙරේ.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

ගැටුම්වල ස්වභාවය හා ඒවායේ බාහිර තත්ත්වයන් පිළිබඳ විමසා බැලීමේ දී විවිධ වර්ගීකරණයන් දක්නට ලැබේ. ගැටුම් කෙසේ

විසඳා ගන්නේ ද යන්න තීරණය කිරීමේ දී නිශ්චිත වශයෙන් ම ගැටුම්වල ස්වභාවය හඳුනාගෙන සිටීම ඉතා වැදගත් සාධකයක් වෙයි. එකිනෙකාගේ පැවැත්මට අභියෝග නොකරන ගැටුම්වලට වඩා එකිනෙකාගේ පැවැත්මට අභියෝග හා තර්ජන එල්ල කරන ගැටුම් බොහෝ ප්‍රචණ්ඩකාරී වන්නාසේ ම නිරාකරණය කිරීම අපහසුවන්නක් බව නූතන විද්වතුන්ගේ මතය යි. ඒ අනුව ගැටුම් ඇතිවීමට හේතුවන්නා වූ මූලබීජයන්ට අනුකූලව ගැටුම් ප්‍රධාන කොටස් තුනකින් යුක්ත ව විස්තර කෙරේ. ඒවා පිළිවෙළින් අයිතිය මත සිදුවන ගැටුම් (භූමි ප්‍රදේශ හෝ සම්පත් හා සම්බන්ධිත ගැටුම්), සාරධර්ම මත සිදුවන ගැටුම් (ආගම, දේශපාලන මතවාදය හා ජනවාර්ගිකත්වය මත පදනම් වන ගැටුම්) හා සම්බන්ධතා මත සිදුවන ගැටුම් (බහුතරය හා සුළුතරය අතර ගැටුම් හා පාලක පන්තිය හා පාලිත පන්තිය අතර ඇතිවන ගැටුම්) යනුවෙන් හඳුනාගත හැකි වෙයි. (**සමරනායක, ගාමිණී. 2003,15**)

ඔමෙන් ම නූතන වර්ගීකරණයන්ට අනුව ගැටුම් පිළිබඳ දක්වා ඇති ප්‍රභේදයන් කිහිපයක් පහත දැක්වේ.

- ක්ෂුද්‍ර ගැටුම් - (Micro Conflicts)
- විශාල ගැටුම් - (Macro Conflicts)
- අන්තර් රාජ්‍ය ගැටුම් - (Inter state Conflicts)
- අන්තර් රාජ්‍ය නොවන ගැටුම් - (Non inter State Conflicts)
- සමමිතික ගැටුම් - (Symmetric Conflicts)
- අසමමිතික ගැටුම් - (Asymmetric Conflicts)

(**කරුණාදාස, ඩබ්ලිව්.එම්. 2003:52-54**)

තත් වර්ගීකරණයට අදාළ ව, රටක හෝ සමාජයක ඇතිවන්නා වූ ගැටුම් එහි ස්වභාවයට හා ස්වරූපයට අනුව උක්ත කවර ම වූ හෝ වර්ගයකට අයත් වන බව හඳුනාගත හැකිවෙයි. උපදේශ සාහිත්‍යයේ දක්නට ලැබෙන ගැටුම් ද උක්ත වර්ගීකරණයන්ට අනුයුක්ත කොට

දැක්විය හැකි වෙයි. ඒ අනුව උපදේශ සාහිත්‍යයේ අන්තර්ගත ගැටුම් පිළිබඳ විමසා බැලීමේ දී ද තත් ස්වභාවයෙන් යුක්ත ගැටුම් හඳුනාගත හැකි ය. ඒ අනුව පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ දක්නට ඇති කතා මගින් මෙන් ම නීති හා වෛරාග්‍ය ශතකයන්හි අන්තර්ගත ශ්ලෝක මගින් ඉදිරිපත් කරන සිද්ධි හා අවස්ථාවන් පිළිබඳ විමසීමේ දී එහි ගෙනහැර දක්වන ගැටුම් සිදුවන අවස්ථාවන් කිහිපයක් දැකිය හැකි ය.

- රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම්
- අන්තර් රාජ්‍ය නොවන ගැටුම්
- මානසික වශයෙන් පුද්ගලයන් තුළ ඇතිවන ගැටුම්

ආදි ගැටුම් අවස්ථාවන් තුළ උක්ත ලක්ෂණයන් හඳුනාගත හැකි වෙයි. විශේෂයෙන් මෙම ගැටුම් පැනනැගී ඇති හේතු කාරණා පිළිබඳ විමසා බලන විට එකිනෙකට වෙනස් වන තම අභිමතාර්ථයන් ඉටුකර ගැනීමට යාමේ ප්‍රතිඵලයක් වශයෙන් සමුත්පන්න වූ ඒවා බව හඳුනාගත හැකිවෙයි.

**රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම්**

පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය පිළිබඳ විමසා බැලීමේ දී රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම් කිහිපයක් අපට දැක ගැනීමට හැකියාව ලැබේ. මෙම ගැටුම් ඉහත සඳහන් කරන ලද අයිතිය මත සිදුවන ගැටුම් ගණයෙහි ලා සඳහන් කළ හැකිවෙයි. එහිලා විශේෂයෙන් පඤ්චතන්ත්‍රයේ කාකෝලූකීය තන්ත්‍රයේ අන්තර්ගත මේඝවර්ණ නම් කපුටු රාජයා සහ අරිමර්දන නම් බකමූහුණු රාජයා අතර ඇතිවන ගැටුමත් (PCT,1912: काकोलूकीयम्, P 134-180), පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද තන්ත්‍රයේ අන්තර්ගත කෞලික රථකාර කථාවේ එන විෂ්ණු වෙස් ගත් කෞලිකයා නිසා එම රාජ්‍යය සහ අනිකුත් රාජ්‍යයන් සමඟ ඇති වූ ගැටුම (PCT,1912: मित्रभेदम्, P 155-170) සහ හිතෝපදේශයේ විග්‍රහ කාණ්ඩයේ අන්තර්ගත චිත්‍රවර්ණ නම් මොණර රජු සහ හිරණ්‍යගර්භ නම් හංස රාජයා අතර ඇතිවන ගැටුම (HPD,1976: विग्रहः, P 61-86) රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම්

වශයෙන් හඳුනාගත හැකිවෙයි. උදාහරණ වශයෙන් පඤ්චතන්ත්‍රයේ කාකෝලූකීය තන්ත්‍රයේ අන්තර්ගත මේඝවර්ණ නම් කපුටු රාජයා සහ අරිමර්දන නම් බකමුහුණු රාජයා අතර ඇතිවන ගැටුම සැකවින් පහත දැක්වේ.

''දක්ෂිණ දේශයේ මහ නගරයක් ඇත. ඒ නගරයට සමීපයෙහි විශාල නුග රුකක විශාල පිරිවර ඇති මේඝවර්ණ නමැති කවුඩු රජෙක් විය. සහජයෙන් ම ප්‍රතිමල්ලවයෙකු වු අරිමර්දන නම් බකමුහුණු රජෙක් ද මීට නුදුරු ගල් ගුහාවක වෙසෙයි. හෙතෙමේ ද මහත් පිරිවර ඇත්තෙකි. මොහු කපුටන් කෙරෙහි වෛර වූයේ දුටු දුටු තැන ඔවුන් අල්ලා මරයි. ටික කලකින් නුග ගස හාත්පස කවුඩු අස්ථිවලින් පිරී ගියේ ය. දිනක් මේඝවර්ණ රජතෙමේ තම මන්ත්‍රී මණ්ඩලයේ උජ්ජීවි, සංජීවි, අනුජීවි, ප්‍රජීවි හා චිරංජීවි යන මන්ත්‍රීවරුන්ගෙන් සතුරා මැඬීමට උපාය සෙවී ය.

ඒ අනුව පිළිවෙළින් උජ්ජීවි තෙමේ 'අපේ සතුරා බලවත් බැවින් සටනට නොයා ඔහු හා සමාදානයෙන් පැවැත්විය යුතු බව ද'' සංජීවි තෙමේ ''උජ්ජීවිගේ අදහසට එකඟ නොවී සතුරා කෲර නම්, තෘෂ්ණාභරිත නම්, ප්‍රතිපත්ති රහිත නම් සමාදානයෙන් නොපැවැත්විය යුතු යැයි ද, අනුජීවි තෙමේ ''සතුරා කපටි ය. බලසම්පන්න ය. යුක්තියට ගරු නො කරයි. එහෙයින් ඔහු සමඟ සමාදානයක් නොපැවැත්විය යුතු ය. යුද්ධයෙහි ද නොයෙදිය යුතු ය. බල කඳවුර පමණක් වෙනස් කළ යුතු යැයි ද, ප්‍රජීවි තෙමේ ''යුද්ධය හෝ සමාදානය හෝ මගෙන් අනුමත නොවන්නේ යැයි ද, චිරංජීවි තෙමේ ''සයවැදෑරුම් යුද්ධ තන්ත්‍රය අතුරෙන් සංග්‍රහයට මම කැමැත්තෙමි. ප්‍රබල සතුරාගෙන් විපතක් එළඹ සිටි කල එයින් ආත්මාරක්ෂාව සලසා ගැනීම සඳහා ප්‍රබල වූ හෝ නොවූ මිතුරෙකු සහායට ගැනීමෙන් මෙහි දී සංග්‍රහ තන්ත්‍රය යෙදවිය යුතු බව ද යනුවෙන් ඔවුනොවුන්ගේ අදහස් දැක් වූ අතර මේඝවර්ණ කවුඩු රජතෙමේ ඔවුන්ට ස්තුති කොට සැමට වඩා යුද්ධ තන්ත්‍රයත්, යුද්ධෝපායත් ගැන මහත් අවබෝධයක් ඇති මහාප්‍රාඥ, වෘද්ධ, උපශාන්ත ස්ථිරජීවි නම් කවුඩාට හිස නමා ආචාර කොට මෙහි දී අනුගමනය කළ යුතු අයුරු පහදන්නැයි අයැදී ය. පෙර මන්ත්‍රීවරුන් විසින් ඒ ඒ අවස්ථාවට අනුරූප අංග දැක් වූ බවත් මේ එළඹ ඇති අවස්ථාවට වඩා සුදුසු වන්නේ ද්වෛධී

භාවය මිස අනෙකක් නොවන බවත් හෙතෙම කීවේ ය. තව ද, සමාදාන ප්‍රයත්නයකින් සතුරාගේ විශ්වාසය දිනාගෙන අවස්ථාව බලා මර්මස්ථානයට පහරදීම එයින් අදහස් වන බව හෙතෙම වැඩිදුරටත් දැක්වී ය. (PCT,1912: काकोलूकीयम्, P 134-145), (මහානාම හිමි, මිනුවන්ගමුවේ. 2011ඃප්‍රස්තාවනාව, පිටුව ෦෦ඪ-෦෦ඪස)

එයිනික්බිති ස්ථිරජීවිගේ උපදෙස් මත මේඝවර්ණ තෙමේ ස්ථිරජීවි සමඟ දරුණු කලහයක් ඇති කරගෙන ඔහුට බරපතල තුවාල සිදුකොට වාසස්ථානය කරගෙන සිටි ගසෙන් බිමට දමා සිය පිරිසත් සමඟ වෙනත් ස්ථානයකට ගමන් කරයි. මෙම කලහය බලාගෙන සිටි අරිමර්දන නම් බකමුහුණු රජුගේ චරපුරුෂයා එම සිද්ධිය පිළිබඳ ඔහු ව දැනුවත් කරයි. එය ඇසූ බකමුහුණු රජතෙමේ ඇඳිරි වැටී තිබෙනු දැක පලායන සතුරු කපුටන්ට පහරදීම සඳහා පිටත් වන ලෙස සිය සේනාවට දැන්වීය. රජුගේ අණින් කවුඩන්ට පහරදීම සඳහා ඔවුන් වාසය කළ නුගරුක වෙත ගිය ද එහි එකදු කපුටෙක් නොවීය. වටපිට සොයා බලා සියලු සතුරන් විනාශ කරන ලෙස අරිමර්දන තම සේනාවට අණ කළේ ය. මෙම අවස්ථාවේ ස්ථිරජීවි නම් කපුටා ද ගස මුල වැටී සිටියේ තමන් එහි සිටින බව ඇගවීමට ශබ්ද කළේ ය. බකමූණු ඔහු නැසීමට එතැනට පැමිණි පසු තමන්ට බකමූණු රජුට ඉතා වැදගත් තොරතුරු රැසක් පැවසීමට ඇති බව පවසන ලදුව බකමූණු රජු එතැනට පිවිසියේ ය. එතැනට පිවිසි රජතෙමේ මේ කුමක් වූයේ දැයි විමසූ විට ''මේඝවර්ණයා ඊයේ නුඹගේ බලදුර්ගය ආක්‍රමණය කිරීමට සූදානම් වන වේලාවේ අප දුර්වල යයි ද ඔබ වහන්සේ බලසම්පන්න යයි ද එනිසා ආක්‍රමණය නොකරන්න යැයි පැවසූ හෙයින් මා ඔබ වහන්සේගේ චරපුරුෂයෙකු යැයි කියා මෙලෙස හිරිහැර කොට පලාගිය බවත් දැන් තමන්ට ඇත්තේ බකමුහුණු රජුගේ සරණ බවත් මේඝවර්ණයාගෙන් පළිගත යුතු අතර ඒ සඳහා ඔහුගේ බලදුර්ගය ඔබවහන්සේට පෙන්වන්නෙමි යැයි ද පැවසී ය.'' මෙයින් පසු බකමුහුණු රජු තම ප්‍රධාන අනුශාසකවරුන් ගෙන්වා ස්ථිරජීවි නම් මහලු කවුඩාට කුමක් කළ යුතු දැයි විමසී ය. එහිදි රක්තාක්ෂී නම් මහලු බකමුහුණා 'මොහු අප වංශයේ පරම සතුරෙකි කල්පනා නොකොට වහාම මරා දමන ලෙස දැන්වී ය.' නමුත් ක්‍රෑරාක්ෂ, දීප්තාක්ෂ, වක්‍රනාස හා ප්‍රාකාරකර්ණ යන මන්ත්‍රීවරු ඔහුගෙන් ප්‍රයෝජන ඇති හෙයින් ඔහුට අවශ්‍ය පහසුකම් සපයා ඔහු රැකගත යුතු බව පැවසී ය. නමුත්

රක්තාක්ෂි තෙමේ තරයේ කියා සිටියේ ඔහු ව විනාශ කළයුතු බවයි. එයට අවනත නොවූ අරිමර්දන තෙමේ තීක්ෂණජීවට අවශ්‍ය පහසුකම් සපය යි. එයින් කලකිරුණු රක්තාක්ෂි තෙමේ ඉදිරියේ විශාල කරදරයක් වන බව දැන තම පිරිස සමඟ බලදුර්ගයෙන් නික්මෙයි. ස්ථිරජීවි ද තම සැලසුමට අනුව බලදුර්ගයේ දොරටුව සමීපයේ වාසය කිරීමට අවශ්‍ය පහසුකම් සපයන ලෙස දන්වයි. ඒ අනුව ම කටයුතු සිදුවන අතර ස්ථිරජීවි තෙමේ ද එහි සිට කූඩුවක් තනාගැනීමේ ව්‍යාජයෙන් විශාල දර කෝටු ආදියෙන් කොටු දොරකඩ අවහිර කළේ ය. ඉන්පසු බකමූහුණන් නිදා හුන් කල මේඝවර්ණ වෙත ගොස් ''දේවයන් වහන්ස, සතුරු බලදුර්ගය විනාශ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කළේ ය. ගිනිහුල බැගින් ගත් සේනාවක් සමඟ වහා එහි එනුමැනවි. මා විසින් බලදුර්ගයේ දොරකඩ ගොඩගසා ඇති දරගොඩට ගිනි ඇවිලුණු කල සතුරු මුළ සමූල ඝාතනය වන්නේ යැයි'' පැවසී ය. මේඝ වර්ණ ද ගිනිහුල බැගින් ගත් සිය පිරිවර සමඟ ගොස් බලදුර්ගයේ දොරකඩ ගොඩ ගසා තිබූ දර ගොඩට ගිනි තැබුවේ ය. දිවා සමයේ අන්ධව නිද්‍රාවෙන් සිටි සකල බකමූහුණු ගණයාම රක්තාක්ෂිගේ අවවාදය නොපිළිගැනීම ගැන පසුතැවිලි වෙමින් පිළිස්සී විනාශයට පත්වූහ (PCT,1912: काकोलूकीयम्, P 155-170).

ඒ උදාහරණ වශයෙන් දක්වන ලද මේඝවර්ණ නම් කපුටු රාජයා සහ අරිමර්දන නම් බකමූහුණු රාජයා අතර ඇතිවන ගැටුම හා ඉහත අනෙකුත් ගැටුම් පිළිබඳ අර්ථ නිරූපණය කිරීමේ දී විශාල ගැටුම්- (Macro Conflicts), අන්තර් රාජ්‍ය ගැටුම්- (Interstate Conflicts), සම්මිතික ගැටුම්- (Symmetric Conflicts) යන වර්ගීකරණයන්හි ලා විස්තර කළ හැකි වෙයි.

**අන්තර් රාජ්‍ය නොවන පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ගැටුම්**

අන්තර් රාජ්‍ය නොවන පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ගැටුම් පිළිබඳ විමසා බැලීමේදී එවැනි ගැටුම්වලට අදාළ කතාන්දර රාශියක් පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ දැකගත හැකි වෙයි. විශේෂයෙන් එම ගැටුම් ක්ෂුද්‍ර ගැටුම්- (Micro Conflicts), අන්තර් රාජ්‍ය නොවන ගැටුම්- (Non inter State Conflicts), අසම්මිතික ගැටුම්- (Asymmetric Conflicts) වශයෙන් හඳුනාගත හැකි ය.

පඤ්චතන්ත්‍රයේ එන ටිට්ටිභ දම්පති යුවළගේ කතාව (PCT,1912: मित्रभेदम्, P 65-66) එම කථාව පහත පරිදි වේ.

''තම බිරිඳ සමඟ එක්තරා කිරලෙක් සමුද්‍රය ආසන්නයේ ගසක වාසය කළේ ය. අනුක්‍රමයෙන් ගැබ්බර වූ කිරල ධේනුව දිනක් තම සැමියාට 'ප්‍රසූතය සඳහා ඉතා ළඟය බිජු දැමීමට වහාම සුදුසු තැනක් සකස් කරන්න.' යැයි කීවා ය. බිජු දැමීමට වෙනත් තැනක් කුමට ද පරම්පරාවෙන් අපට හිමිව ඇති මේ ගසෙහි ම හිඳ බිජු දමන්න යැයි කිරලා කීය. එය ප්‍රතික්ෂේප කරමින් 'මේ ගස සමුද්‍රය ආසන්නයේ පිහිටා තිබේ. සමුද්‍රය ඉතා දරුණු ය. කුමන මොහොතක වුව ද රැල්ලක් ගසා පැටවුන් ගසා ගන්නේ යැයි' කිරල ධේනුව පැවසී ය. එවිට කිරලා මහත් අහංකාරයෙන් 'සාගරය මා ඉතා හොඳින් හඳුනන්නේ ය. මා හට සතුරුකම් කිරීමට ඔහු එඩිතර නො වන්නේ ය. බිය නොවී මෙහි බිජු දමන්න යැයි' කීවේ ය. මෙය සාගරය ද අසාගෙන සිටියේ ය. එයින් නිර්භය වු කිරල ධේනුව ද කල් පැමිණි කල්හි එම ගසෙහි ම රිකිල්ලක බැඳුණු කැදැල්ලෙහි බිජු දැමී ය. සාගරය ද කිරලාගේ අහංකාරකම නැති කළයුතු යැයි කල්පනා කොට කිරල යුවළ ගොදුරු සොයා ගිය අවස්ථාවක තම රැල්ලක් අත වශයෙන් යොමු කොට කිරල බිත්තර පැහැර ගත්තේ ය. එය දැනගත් කිරල ධේනුව කිරලාට දොස් නඟමින් විලාප තියන්නට වූ අතර 'බිය නොවන්න. මගේ තුඩගින් ජලය ඉස සාගරය සිඳවන්නෙමියි' කියා කිරලා තුඩගින් ජලය ඉසින්නට විය. එය බලා සිටින කිරල ධේනුව මෙතරම් විශාල සාගරයක් නුඹට තනිව ම හිස් කළ නො හැක. මිත්‍රයන්ගේ උපකාරය ලබාගන්න යැයි පවස යි. ඉන්පසු පක්ෂීන් විශාල පිරිසක් එකතුව ජලය ඉසීමට පටන් ගත්ත ද එය ද සාර්ථක නො වෙයි. ඉනික්බිති බුද්ධිමත් පක්ෂියෙකුගේ මාර්ගෙ ෝපදේශකත්වයෙන් සියලු පක්ෂීහු තම රජු වූ ගුරුළු රාජයා වෙත ගොස් 'සාගරය විසින් කුරුලු බිත්තර පැහැර ගන්නා බවත් එසේ වුවහොත් ටික කලකින් පක්ෂීන් විනාශ වී යන බවත් එයට සුදුසු පිළියමක් යොදන ලෙසත්' ඉල්ලා සිටිති.

මේ අවස්ථාවේ ම දේවකාර්යයක සඳහා පිටත් වීමට අවශ්‍ය හෙයින් වහාම පැමිණෙන්න යැයි විෂ්ණු දෙවියන්ගේ පණිවුඩයක් ගත් දේව දූතයෙකු පැමිණෙයි. එම අවස්ථාවේ ගුරුළා 'විෂ්ණු දෙවියන්ගේ සේවකයා වූ මගේ යෙහෙළියකගේ බිජුවට විෂ්ණු දෙවියන්ගේ

විමානය වූ සාගරය විසින් පැහැරගෙන ඇත. එනිසා සේවක වූ තමාගෙන් ප්‍රයෝජනයක් වේ නම් එයට සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නා තුරු සේවයට නොපැමිණෙන්නෙමියි, පැවසූ බව විෂ්ණු දෙවියන්ට දන්වන ලෙස පවසා' දූතයාව පිටත් කර හරියි.

එම අවස්ථාවේ යහපත් සේවකයෙකු අහිමි කරගැනීම නුසුදුසු යැයි කල්පනා කරන විෂ්ණු දිව්‍ය රාජයා තෙමේ ම ගුරුළා හමුවට පැමිණ තොරතුරු විමසන අතර සාගරය පැහැරගත් යෙහෙළියගේ බිජුවට ලබාදීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා සිටියි. ඒ අනුව පළමු ව සාගරය විසින් පැහැරගත් කිරල බිජුවට ගන්නෙමු. දෙවනු ව දේවකාර්යය සඳහා දිව්‍ය ලෝකට යන්නෙමුයි. විෂ්ණු දෙවියන් ප්‍රකාශ කළේ ය. ගුරුළා ද මේ යෝජනාවට එකඟ වූයෙන් විෂ්ණු දෙව්රජ වහාම උරතලයෙන් රන් දුන්න අතට ගෙන අග්නි ශරයක් එහි තබා කෝපාග්නිය විහිදෙන දෑසින් සාගරය දෙස බලා 'එම්ලබ සාගරය, දුෂ්ටය. තා මාගේ සේවකයාගේ සේවිකාවක වූ කිරල ධේනුවගේ බිජුවට පැහැර ගත්තෙහි ය. එය ආපසු දෙව. මොහොතකදු ප්‍රමාද නොවෙව. වහා ම මගේ අණට කීකරු නොවුවහොත් තා වියළි බවට පත්කොට නිරුදක කාන්තාරයක් කරන්නෙමි යි.' ගුගුළේ ය. මෙයින් කම්පනයෙන් ප්‍රකම්පනයට පත් වූ සාගරය තෙමේ වහා ම කිරල බිජු රැගෙන කිරල කැදැල්ලෙහි තැන්පත් කළේ ය.'' (PCT, 1912: मित्रभेदम्, ඊ ६५–६६)

උක්ත කථාවට අමතරව නිල් දියට වැටුණු සිවලා සහ සිංහයන් ඇතුළු සත්ත්වයන්ගේ කතාව (Ibid, मित्रभेदम्, P 55-56), දන්තිල හා ගෝරම්භ අතර ඇති වූ ගැටුම පිළිබඳ කතාව (Ibid, मित्रभेदम्, P 22-26), සිංහයා හා මහලු සාවා පිළිබඳ කතාව (Ibid, मित्रभेदम्, P 46-50), ඇතා රැවටූ සාවාගේ කතාව (Ibid, काकोलूकीयम् , P 145-147), නාගයන් දෙදෙනා සහ රජකුමරිය පිළිබඳ කතාව (Ibid, काकोलूकीयम्, P 165-167), යකඩ කෑ මීයන් පිළිබඳ කතාව (Ibid, मित्रभेदम्, P 88-89), කකුළු මස් කෑමට කැමති වූ කොකාගේ කතාව (Ibid, मित्रभेदम्, P 44-46), ඇතෙකු සමඟ සටන් කළ කුඩා සත්ත්වයන් පිළිබඳ කතාව (Ibid,मित्रभेदम्, P 69-71) ආදි කතා පුද්ගල කණ්ඩායම් අතර ඇති වන ගැටුම් සඳහා උදාහරණ වෙයි.

**මානසික වශයෙන් පුද්ගලයන් තුළ ඇතිවන ගැටුම්**

උපදේශ සාහිත්‍යයේ අන්තර්ගත කතා අතර පුද්ගලයන් තුළ මානසික වශයෙන් ඇතිවන ගැටුම් බොහෝමයක් දක්නට ලැබේ. එවැනි අවස්ථාවන් පිළිබඳ විමසීමේ දී විශේෂයෙන් පවුල් ජීවිතය මුල් කරගෙන අඹුසැමියන්ගේ විෂමාචාර ක්‍රියාවන්, හැසිරීම් සහ දළ ආශාවන්ගෙන් කටයුතු කිරීමට උත්සාහ කිරීම මගින් මුහුණදීමට සිදුවන විවිධ ප්‍රශ්න හා ගැටලු හේතුවෙන් විටෙක බිරිඳ නිසා ස්වාමියා තුළත් ස්වාමියා නිසා බිරිඳ තුළත් පැන නඟින මානසික ගැටීම් හඳුනාගත හැකි වෙයි. ඒ අනුව එයට උදාහරණ වශයෙන් පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද කාණ්ඩයේ එන ජ්ෂකාර ස්ත්‍රිය පිළිබඳ කතාව දැක්විය හැකි වේ.

''භික්ෂාවෙන් ලැබෙන පිරිකර මුදල් පොට්ටනියක බැඳ නිරන්තරයෙන් කිසිල්ලේ ගසාගෙන ආරක්ෂා කරමින් සිටි දේවශර්ම නම් පිරිවැජියාගේ එම මුදල් පොට්ටනිය සිය ශිෂ්‍යයා වශයෙන් කටයුතු කරන ලද ආෂාඪභූති නම් සොරා විසින් සොරකම් කරන ලදි. එයින් දුකට පත් ඔහු සවස් කාලයේ එක්තරා ගම් පියසකට පැමිණියේ ය. අනතුරු ව එම ගමේ කිසියම් රෙදිවියන්නෙක් බිරිඳ සමඟ මද්‍ය පානය සඳහා නුවරට යන්නේ දේවශර්මට හමුවිය. ඔහු දැක 'මිත්‍රය මම හිරු අවරට ගිය වෙලාවෙහි පැමිණි අමුත්තෙක්මි. මේ ගමෙහි මම දන්නා වෙනත් කිසිවෙකු ද නැත. එනිසා ආගන්තුක සත්කාර පින කරගන්න යැයි' කීය. කෞලිකයා එය අසා භාර්යාව අමතා, 'නුඹ නැවතී පා සේදීම් ආහාර දීම් යහන් දීම් ආදියෙන් මොහුට ආගන්තුක සත්කාර කරමින් එහි ම සිටින්න මම නුඹ සඳහා බොහෝ මත්පැන් ගෙන එන්නෙමියි.' කියා පිටත් විය. පර පුරුෂයන් සෙවුනා වූ එම භාර්යාව ද එම දේවශර්ම රැගෙන දේවදත්ත නම් සොර සැමියා පිළිබඳ සිතමින් ගෙට ගියා ය.

ඉක්බිති කෞලික භාර්යාව ගෙට ගොස් දේවශර්මට පහ වූ ඇතිරිලි ඇති බිඳුණු ඇඳක් දී මම ගමට අලුතින් පැමිණි යෙහෙළිය හමු වී පැමිණෙන තෙක් සුවසේ සිටින්න.' යැයි පවසා අලංකාර ලෙස සැරසී දේවදත්ත වෙත යන්නේ මඳයෙන් මත්ව මත්පැන් ගෙන පා පැකිළෙමින් නිවසට පැමිණෙන තම ස්වාමියා දැක ඉක්මනට ආපසු

හැරී ගෙට පැමිණ ඉවත් කරන ලද ආභරණ ආදිය ඇතිව පෙර පරිදිම සිටියා ය. කෞලිකයා ද කරන ලද සැරසීම් ඇතිව පැනයන ඇය දැක මුලින් ම ආරංචි මාත්‍රයෙන් ඇය පිළිබඳ අසන ලද තොරතුරුවලින් කැළඹුණු සිත් ඇත්තේ තමන්ගේ ස්වරූපය සඟවා සිටිය ද ඇයගේ එම ක්‍රියාව දැක ප්‍රත්‍යක්ෂ වශයෙන් ලද ආරංචි සැබෑ යැයි විශ්වාස කළේ ක්‍රෝධයට පත්ව ගෙට ගොස් ඇයට කීය. 'බොල පවිටු දුරාචාර තැනැත්තිය, කොහි පිටත් වූවෙහි ද' ඇය කීය. මා නුඹ සමීපයෙන් පැමිණි පසු කිසි තැනැක නික්ම නො ගියෙමි. කුමකට මත්පැනින් මත්ව නොගැළපෙන දේ කියන්නෙහි' යැයි.

එය අසා කෞලිකයා නුසුදුසු කථාව ද වෙස් පෙරළිය ද බලා ඇයට කීය. 'දුරාචාර තැනැත්තිය, තා පිළිබඳ ලෝකයාගේ කථා මා විසින් බොහෝ කලක් අසන ලදි. එය අද සැබැවින් ම දක්නා ලදි. එයට සුදුසු දඬුවමක් කරන්නෙමියි ' කියා. කෞලිකයා ඇයට මුගුරකින් දැඩි ලෙස තළා කණුවකට අල්ලා බැඳ මත් බවින් ව්‍යාකූල වූයේ නින්දට වැටුණි. මේ අතර ඇයගේ යෙහෙළිය වූ කරණවැමි බිරිය කෞලික නිදි බව දැන ඇය වෙත ගොස් 'දේවදත්ත තෙමේ නුඹ එනතෙක් බලා සිටින්නේ' යැයි කීය. එවිට අද දින නුඹ සමඟ සමාගමයක් නොවන බව ඔහුට පවසන ලෙස කෞලිකයාගේ බිරිඳ සිය යෙහෙළියට පැවසී ය. එය සුදුසු නොවන දෙයක් බව පවසන කරණවැමි බිරිඳ කෞලිකයා තදින් ම නින්දට වැටී ඇති නිසා නුඹ වෙනුවට තමා බැඳ දේවදත්ත වෙතට යන ලෙස පැවසී ය. ඇය ද කරණවැමී බිරිඳ කණුවෙහි බැඳ දේවදත්ත වෙත ගියා ය. ඉන් අනතුරු ව කිසියම් වේලාවක කෞලිකයා නැඟී සිටියේ පහ වූ මත් බව හා කෝපය ඇත්තේ ඇයට කීය 'පවිටු තැනැත්තිය මින්පසු රළු වදන් නො කියව. ගෙයන් පිටව යාම ද නො කරව.' යැයි. කරණවැමි බිරිය කථා කිරීමට බියෙන් කිසිවක් නො කීවා ය. කෞලිකයා නැවත නැවතත් එය ම කීව ද පිළිතුරක් නොවූ තැන කෝපයෙන් සැතක් ගෙන ඇගේ නාසය කපා නින්දට වැටුණි. බඩසයින් පෙළෙමින් සිටි නිදිවර්ජිතව සිටි දේවශර්ම ද ඒ සියලු ස්ත්‍රී චර්යා දුටුවේ ය.

ඉක්බිති දේවදත්ත සමඟ කැමති පරිදි රති සුව විදි ඒ කෞලිකයාගේ බිරිඳ ටික වේලාවකින් ගෙට පැමිණ ඒ දුෂ්ට කෞලිකයා අවදි වූයේ ද කිසි කරදරයක් සිදුවූයේ දැයි යෙහෙළියගෙන් විමසී

ය. නාසයට හැර සෙසු සිරුරට යහපත් යැයි ඇය කීවා ය. ඉන්පසු පෙර පරිදි ම කෞලික බිරිඳ කණුවෙහි බැඳ ඇය සිය නිවසට ගියා ය. කෞලිකයා නැවත නැගිට ඇයට කීවේ ය. 'කුලටාව දැනුදු කථා නොකරහි ද නැවත කන් සිඳීමෙන් මීට වඩා දරුණු දඬුවමක් කරන්න ද' යැයි. අනතුරුව ඇය කෝප සහිත ව නින්දා සහතිව කීවා ය. 'මහා මෝඩය නින්දවේවා , කවරෙක් ශ්‍රේෂ්ඨ පතිව්‍රතා ඇති මට අවමන් කරන්නට හෝ අංගඡේදනය කරන්නට සමත් වේද එය සියලු ලෝක පාලක දෙවිවරු අසත්වා.' ඉදින් මගේ පතිව්‍රතා බවක් ඇතිනම් සිතිනිදු පරපුරුෂ සේවනයක් නොකැමති වන ලදු නම් ඒ හේතුවෙන් දෙවියෝ නැවතත් මගේ නාසය පෙරපරිදිම තුවාල නැත්තක් කෙරෙත්වා. ඉදින් මා පිළිබඳ කිසියම් සැකයක් ඇතිනම් මා අළු කෙරේවායි කියා නැවත ඒ කෞලිකයාට කීවා ය. 'එම්බා දුෂ්ටය, බලව මාගේ පතිව්‍රතා බලයෙන් නාසය පෙර පරිදිම විය.' අනතුරුව කෞලිකයා ගිනි හුලක් ගෙන බලන්නේ නොසිඳුණු නාසය ද පොළවෙහි ගළා ගිය රුධිරය ද දක්නා ලදි. අනතුරුව හෙතෙම විස්මයට පැමිණි සිත් ඇත්තේ ඇය බන්ධනයෙන් මුදා ඇදෙහි නන්වා සියගණන් ප්‍රිය තෙපුලෙන් සතුටු කළේ ය.'' (PCT,1912: मित्रभेदम्, P 31-37)

උක්ත කථාවට අමතර ව වෙළඳ පුත්‍රයා පිළිබඳ කතාව (Ibid, मित्रप्राप्तिकम्, P 116-119), මහලු සිටාණන් හා තරුණ කාන්තාව පිළිබඳ කතාව (HPD,१९६७: मित्रलाभः, P 19-20), යඥදත්ත හා ඔහුගේ බිරිඳ පිළිබඳ කතා පුවත (PCT,1912: काकोलूकीयम्, P 174-175), සිය බිරිඳගේ බස් ඇසු කෞලිකයා පිළිබඳ කතා පුවත (PCT,1912: अपरीक्षितकारकम्, P 242-244), ශීලයෙන් ගිලිහුණු වෙළෙන්දා සහ භාර්යාව පිළිබඳ කතා පුවත (HPD,1967: मित्रलाभः, P 28-30), ගොපලු ලිය ගම්මුදලි හා ඔහුගේ පුත්‍රයා පිළිබඳ කතාව (HPD,1967: सुहृद्भेदः, P 50-51), කරාල මුඛ නම් කිඹුලා සහ ඔහුගේ බිරිඳ පිළිබඳ කතාව (ठइफ१९१२: लब्धप्रणाशम्, P 189-192) ආදිය මගින් පවුල් සංස්ථාවෙහි ඇතිවන විවිධ ප්‍රශ්න හා ස්වාමී භාර්යාවන්ගේ වැරදි හැසිරීම් හේතුවෙන් පැන නගින මානසික ගැටුම් හඳුනාගත හැකි ය.

එමෙන් ම සමාජයේ ජීවත් වන පුද්ගලයන් තම ජීවිතයේ මුහුණ දෙන විවිධ අවස්ථාවන් හේතුකොටගෙන මානසික වශයෙන් ගැටීමට ලක්වන බව උපදේශ සාහිත්‍යයේ විවිධ කතා මගින් හඳුනාගත හැකිවෙයි.

පඤ්චතන්ත්‍රයේ කථාමුඛයේ සඳහන් ආකාරයට අමරශක්ති රජතුමා තමන්ගේ දුර්බුද්ධි පුත්‍රයන් තිදෙනා නිසා තම රාජ්‍යයේ සහ රටවැසියාගේ අනාගතයට කුමක් සිදුවේ දැයි මානසික වශයෙන් බරපතල පීඩාවට පත්වෙයි (PCT,1912:कथामुखम्, P 1-3), හිතෝපදේශයේ ප්‍රස්තාවිකාවේ සඳහන් ආකාරයට සුදර්ශන නම් රජතුමා ද නිතර නොමග යන්නා වූ තම පුත්‍රයන් දැක මානසික වශයෙන් දැඩි පීඩාවට පත්ව ඒ පිළිබඳ විවිධ ආකාරයෙන් කල්පනා කරමින් තර්ක විතර්ක කරයි (HPD,1967: प्रस्ताविका, P 2-5). පඤ්චතන්ත්‍රයේ මිත්‍රභේද තන්ත්‍රයේ (PCT,1912: ිमत्रभेदम्, P 6) සහ හිතෝපදේශයේ සුහෘද්භේද කාණ්ඩයේ (HPD,1967: सुहृद्भेदः, P 34-35) දැක්වෙන පරිදි සංජීවකගේ හඬ අසන එම වනයෙහි සිංහයා වූ පිංගලක නම් සිංහයා බියෙන් හා සන්ත්‍රාසයෙන් ඇලළී ගොස් එය කිසිවෙකුට කියාගත නොහැකිව මානසික වශයෙන් ගැටීමට ලක්ව කටයුතු කළ ආකාරය මේ සඳහා තවත් එක් උදාහරණ කතාවකි.

එමෙන් ම පඤ්චතන්ත්‍රයේ අපරීක්ෂිතකාරකයේ එන සිතුවිල්ලෙන් බැඳුණු බමුණා පිළිබඳ කතාව (PCT,1912: अपरीक्षितकारकम्, P 244-245), බමුණා සහ එළුපැටවා පිළිබඳ කතාව (Ibid, काकोलूकीयम्, P 152-153) ආදි කතා මගින් විවිධ හේතූන් නිසා මානසික වශයෙන් මිනිසුන් ගැටීමට ලක්වන අයුරු හඳුනාගත හැකි වෙයි.

මේ අනුව ඉහත දක්වන ලද තොරතුරු පිළිබඳ අවධානය යොමුකරන විට නූතන හා සංස්කෘත උපදේශ සාහිත්‍යයේ පැනෙන ගැටුම්වල ස්වභාවය පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි අතර විශේෂ වශයෙන් සංස්කෘත උපදේශ සාහිත්‍යයෙහි අන්තර්ගත කථාවන්ට අනුව ගැටුම් ඇතිවන පුද්ගල කණ්ඩායම් හා පාරිසරික ස්වභාවයන් කවරේ ද යන්න පිළිබඳවත් කරුණු වටහාගත හැකි වෙයි.

**සමාලෝචනය**

පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය රාජ්‍ය පාලනය සම්බන්ධ නීති ශාස්ත්‍රය ඉගැන්වීම ප්‍රධාන කරගෙන රචනා කර ඇති හෙයින් පාලන තන්ත්‍රයක් තුළ ඇති වන විවිධ ගැටුම් පිළිබඳ අවබෝධකරවීමට එමගින් ප්‍රයත්න දරා ඇති බව තත් ග්‍රන්ථ පරිශීලනය කිරීමේ දී වටහාගත

හැකි වෙයි. රාජ්‍යයන් හා ජන සමාජයේ විවිධ පුද්ගල කණ්ඩායම් අතර පමණක් නොව කේවල වශයෙන් ඒ ඒ පුද්ගලයන් මානසිකව මුහුණ පාන විවිධ ගැටුම් අවස්ථාවන් ද තත් ග්‍රන්ථාගත කථාන්දර හා සිද්ධීන් මගින් හඳුනාගත හැකි බව උක්ත තොරතුරු පිළිබඳ විමසා බලන විට පැහැදිලි වෙයි. ඒ අනුව නූතන අධ්‍යයනයන් තුළින් ගෙනහැර දක්වන ගැටුම් හා ඒවායෙහි ස්වභාවය පිළිබඳ හඳුන්වා දෙන වර්ගීකරණයන්ට අදාළ ව පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ අන්තර්ගත ගැටුම් ද වර්ගීකරණය කළ හැකි බව ඉහත කරුණු මගින් පැහැදිලි වන අතර ඒ පිළිබඳ තවදුරටත් ඉතා පුළුල්ව අධ්‍යයනය කිරීමට මෙම පර්යේෂණය උපයෝගී වනු ඇති බව ද මෙහි ලා සඳහන් කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

HPD- Kale, M.R. (eds) (1967). *Hitopadeśa of Nārāyaṇa*. Delhi: Motilal Banarsidas.

PCT- Kale, M.R. (eds) (1912). *Pañcatantra*. Delhi: Motilal Banarsidass.

මහානාම හිමි, මිනුවන්ගමුවේ. (2011), (පරි.). **පඤ්චතන්ත්‍රයේ කාකොලූකීය**. කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාදාස, ඩබ්ලිව්.එම්. (2003). **ගැටුම් නිරාකරණයට හැඳින්වීමක්**. දෙහිවල: ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ.

**ගැටුම් නිරාකරණ න්‍යාය සහ භාවිතය**, (2003) (සංස්.) රංජිත් දික්වැල්ල, රේණුක ප්‍රියන්ත, ශිරානි හෙට්ටිආරච්චි, වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.

සමරනායක, ගාමිණි. (2003). ''සමාජ ගැටුම් නිර්වචනය සහ ස්වභාවය'', **ගැටුම් නිරාකරණය න්‍යාය හා භාවිතය**, වරකපොල: ආරිය ප්‍රකාශකයෝ, පිටුව 15.